# මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව 2011

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලන් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2011 දෙසැම්බර් 31 දිනට මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳව අදහස් දැක්වීම

#### 1.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

(අ) ආයෝජනය කරනු ලබන භාණ්ඩාගාර බිල්පත් මත පොළිය සහ ස්ථාවර තැන්පතු මත පොලිය උපචිත පදනම මත ගිණුම් ගත කළ යුතු වුවත් සභාවේ ප්‍රතිපත්තිය වූයේ මුදල් පදනම යටතේ ගිණුම් ගත කිරීම වේ. ඒ පිළිබඳ අවශ්‍ය හෙළිදරව් කිරීම් මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) ස්ථාවර වත්කම් වෙනුවෙන් අනුගමනය කල යුතු ක්ෂය ප්‍රතිපත්තිය වන්නේ ස්ථාවර වත්කම් මිලදීගත් වර්ෂයේ සිට වත්කමේ ආයු කාලය පුරා සමානුපාතිකව ක්ෂය කිරීම වුවත් සභාවේ සමාලෝචිත වර්ෂයේ මිලදීගත් ස්ථාවර වත්කම් වෙනුවෙන් එම ක්ෂය ප්‍රතිපත්තිය අනුව ක්ෂය ප්‍රතිපාදනය කිරීම කර නොතිබුණි.

#### 1.2.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) සභාව විසින් 2006 වර්ෂයේ සිට විගණන ගාස්තු ගෙවා නොතිබුණු අතර 2006 වර්ෂයේ සිට 2010 වර්ෂය තෙක් ගෙවිය යුතු විගණන ගාස්තුව ව රු.805,870 ක් උපචිත වියදම් ලෙස වාර්ෂික ගිණුම්වල පෙන්වා නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේදී ප්‍රවාහන අමාත්‍යාංශය විසින් කුලී පදනම මත ලබාගෙන සභාවට වෙන්කර දී තිබූ වාහනයක් වෙනුවෙන් දරන ලද රු.47,782 ක් වූ වියදම සමාලෝචිත වර්ෂයේ සභාවේ වියදමක් ලෙස ගිණුම්වලට නොගෙන 2012 වර්ෂයේදී අමාත්‍යාංශය වෙත එම මුදල ප්‍රතිපූරණය කර එම වර්ෂයේදී වියදමක් ලෙස ගිණුම් ගතකර තිබුණි.

(ඇ) ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලයේ ලියාපදිංචි වී ඇති රක්ෂණ සමාගම් නිකුත් කරන මෝටර් වාහන තෙවන පාර්ශව රක්ෂණ ඔප්පුවලින් ලැබෙන 1% ක දායකත්ව මුදලන් සමාගම් 02 ක් වෙනුවෙන් එකතුව රු.98,212 ක් වූ ලැබිය යුතු රක්ෂණ ආදායම ගිණුම් වල ලැබිය යුතු ආදායම යටතේ හෙළිදරව් කර නොතිබුණි.

(ඈ) මුදල් පදනම මත ආදායම ගිණුම්ගත කිරීම සභාවේ ප්‍රතිපත්තිය වේ.එහෙත් භාණ්ඩාගාර බිල්පත් අංක 06 මගින් 2011 දෙසැම්බර් මස බැංකු ප්‍රකාශනයට බැර වූ රු.62,899 ක මුදල ආදායමක් ලෙස නොසලකා කලින් ලද ආදායමක් ලෙස සැලකීම නිසා ඉහත ගිණුම් ප්‍රතිපත්තියට පටහැනිව සමාලෝචිත වර්ෂයෙ ආදායම එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(ඉ) වර්ෂයට අදාල ස්ථාවර වත්කම් වල මුලු ක්ෂය ප්‍රමාණය රු.148,118 ක් වුවත් එය මූල්‍ය ප්‍රකාශනවල දක්වා තබුණෙ රු.126,597 ක් ලෙසය.එම නිසා සමාලෝචිත වර්ෂයේ ක්ෂය ප්‍රමාණය රු.21,521 කින් අඩුවෙන් දක්වා තිබුණි.

1.2.3 **විගණනය සඳහා සාක්ෂි නොවීම**

(අ) පහත සඳහන් ගනුදෙනු සම්බන්ධයෙන් ඒවා ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකිරීම හේතුවෙන් එවා සතුටුදායක ලෙස සනොක්ෂණය කළ නොහැකි විය.

| විෂය | ගිණුම් අනුව වටිනාකම රු. | ඉදිරිපත් නොව සාක්ෂි |
|---|---|---|
| (i). ස්ථාවර තැන්පත් පොලී | 847,068 | ස්ථාවර තැන්පතු ලේඛනය, ගිණුම් කරණ සටහන් |
| (ii). භාණ්ඩාගාර බිල්පත් පොලී | 2,340,898 | භාණ්ඩාගාර බිල්පත්‍ර ලේඛනය. |
| (iii). රක්ෂණ සමාගම්වලින් ලැබෙන 1% ක ආදායම | 20,873,477 | රක්ෂණ සමාගම් විසින් නිකුත් කරන ලද තෙවන පාර්ශව රක්ෂණ ඔප්පු ආදායම් පිළිබඳ සම්පූර්ණ විස්තර ඇතුලත් ලේඛණය. |

(ආ) <u>අස්ථාන ගත වූ වවුචර්</u>

එකත අගය රු. 162,934 ක් වූ ගෙවීම් වවුචර් 4 ක් විගණනයට ඉදිරිපත් නොවිය.

1.2.4 **<u>නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම</u>**

පහත දැක්වෙන නීති,රීති රෙගුලාසිවලට හා කළමනාකරණ තීරණ යනාදියට අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති,රීති,රෙගුලාසිවලට හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ). <u>මුදල් රෙගුලාසි</u> | |
| (i) මු.රෙ. 135 | කාර්ය මණ්ඩලය සඳහා විධිමත් පරිදි මූල්‍ය බලතල පැවරුමක් සිදුකල යුතු වුවත් එසේ සිදුකර නොතිබුණි. |
| (ii) මු.රෙ. 371 (2) (ආ) | අත්තිකාරම් ලබාදීමේදී එක් අවස්ථාවකදී ලබාදිය යුතු මුදල රු.20,000 ට වැඩි නොවිය යුතු වුවත් සභාව විසින් අවස්ථා 2 කදී රු.100,000 හා රු.50,000 බැගින් ලබා දී තිබුණි. |
| (iii) මු.රෙ. 394 හා 396 | නිකුත් කර තිබූ නමුත් ගෙවීමට ඉදිරිපත් නොකරන ලද මාස 06 ඉක්ම වූ එකතු වටිනාකම රු.10,270 ක් වූ චෙක්පත් 04 ක් සභාවට ලැබුණු අදායමක් ලෙස සැලකීමට හෝ යලි වලංගු කිරීමට කටයුතු කර නොතිබුණි. |
| (iv) මු.රෙ. 756 හා 757 | සභාව විසින් සමාලෝචිත වර්ෂය සඳහා භාණ්ඩ සමීක්ෂණයක් සිදුකර එහි වාර්තා වල පිටපතක් විගණකාධිපති වෙත එවීමට කටයුතු කර නොතිබුණි. |
| (ආ) 2006 අංක 10 දරන දේශීය ආදායම පනත | දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් මෙම සභාව ආදායම් බදුවලින් නිදහස් කර නොතිබුණු නමුත් ඉකුත් වර්ෂවල මෙන්ම සමාලෝචිත වර්ෂයේද බදු ගෙවීමේ අවශ්‍යතාවය හඳුනාගෙන බදු ගෙවීමට කටයුතු කර නොතිබුණි. |

2. **මූල්‍ය සමාලෝචනය**

**මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය සඳහා සභාවේ මෙහෙයුම්වල මූල්‍ය ප්‍රතිඵලය රු.21,877,601 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු.14,667,789 ක අතිරික්තයක් වූයෙන් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.7,209,812 ක වර්ධනයක් පෙන්නුම් කෙරිණි. සභාවේ ප්‍රධාන අදායම් ප්‍රභවය වන රක්ෂණ සමාගම් වලින් දායකත්වයේ වැඩිවීම හා පොළී අදායම මෙම මුල්‍ය ප්‍රතිඵලයෙ වර්ධනයට ප්‍රධාන හේතුව විය.

3. **මෙහෙයුම් සමාලෝචනය**

3.1 **කාර්ය සාධනය**

(අ) මෙම සභාවේ ප්‍රධාන අරමුණක් වන්නේ මාර්ග අනතුරු වලින් තොර සමාජයක් බිහි තිරීම වන අතර මෙම අරමුණ සාක්ෂාත් කර ගැනමේදි පහත කාර්යයන් සම්බන්ධයෙන් සම්බන්ධීකරණයක් පවත්වාගෙන ගිය බවට සාක්ෂි ඉදිරිපත් නොවීය.

* මාර්ග ආරක්ෂාව පිළිබඳ ව්‍යාපෘති සකස් කිරීම සහ ක්‍රියාවට නැංවීම

* රජ්‍ය සහ රාජ්‍ය නොවන සංවිධාන තුළ මාර්ග ආරක්ෂාව හා සම්බන්ධිත කාර්යය සම්බන්ධීකරණය කිරීම

* මාර්ග ආරක්ෂාව පිළිබඳ කටයුතු සඳහා මූල්‍යමය හා වෙනත් සහාය ලබාගැනීම

* මාර්ග ආරක්ෂාව හා සම්බන්ධිත ප්‍රතිපත්තීන් සහ ව්‍යාපෘති පිළිබඳව රජයට උපදෙස් දීම

* සමාන ජාත්‍යන්තර ආයතන සමඟ සබඳතා පැවැත්වීම සහ පළපුරුද්ද පිළිබඳ දැනුම හුවමාරු කර ගැනීම

* සම්බන්ධිත විෂයයන් පිළිබඳ තොරතුරු රැස්කිරීම, පර්යේෂණ පැවැත්වීම සහ ක්ෂේත්‍ර පරීක්ෂණ පැවැත්වීම

* රථ වාහන අනතුරු, රථ වාහන ප්‍රමාණය හා ඒවායේ ලක්ෂණ හා සංයුතිය, මාර්ග ආරක්ෂාව පිළිබඳ දේශීය සහ ජාත්‍යන්තර සංඛ්‍යා ලේඛන පිළිබඳ දත්ත ගබඩාවක් පවත්වාගෙන යාම.

ඉහත කාර්යයන් ඉටු කිරීමේදි අදාළ ආයතන වන මාර්ග සංවර්ධන අධිකාරිය, අදාළ අමාත්‍යාංශය, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය, ප්‍රවාහන අමාත්‍යාංශය හා ඊට සම්බන්ධ සියලු ආයතන, පොලිස් දෙපාර්තමේන්තුවද ආදී ආයතන සමග මාර්ග ආරක්ෂාව විධිමත් කිරීම සම්බන්ධයෙන් සම්බන්ධීකරණයක් පවත්වාගෙන ගිය බවට සාක්ෂි ඉදිරිපත් නොවීය.

(ආ) **වන්දි ගෙවීම**

මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

(i). **වන්දි ගෙවීම ප්‍රමාණවත් නොවීම**

2004 දෙසැම්බර් මාසයේදී පිහිටුවා ඇති මෙම සභාවේ ප්‍රධාන අරමුණක් වන්නේ මාර්ග අනතුරු සිදු කර පලායන හා හඳුනා නොගත් වාහනවලින් අනතුරට පත්ව මියගිය හෝ තුවාලලත් පුද්ගලයින්ගේ යැපෙන්නන් හට මූල්‍ය සහන ලබා දීමයි. ඒ පිළිබඳ පරීක්ෂා කිරීමේදී සභාව ආරම්භ කළ වර්ෂයේ සිට 2011 වර්ෂය අවසාන වනවිට වන්දි මුදල් ලබාදී තිබුණේ ලැබුණ ඉල්ලුම් පත්‍ර 143 කින් ඉල්ලුම්පත් 43 ක් සඳහා රු.1,835,000 ක ප්‍රමාණයක් බව අනාවරණය විය. ඉල්ලුම්පත්‍ර 47 ක් සඳහා අදාළ සහතික සනාථ කිරීම් ලැබීම්වල ඇති වී ඇති ප්‍රමාදය එම වන්දි ගෙවීම ප්‍රමාදයට හේතු වී තිබුණි. ආරම්භක වර්ෂයේ සිට සමාලොචිත වර්ෂය දක්වා අරමුදලේ ඇති සමුච්චිත මුදල රු.121,272,202 ක් වුවත් එම කාලපරිච්ඡේදය තුලදී ගෙවා ඇති වන්දි මුදල් ප්‍රමාණය අරමුදලේ මළු මුදල හා සැසඳීමේදී 1.6% ක ප්‍රමාණයක් බව නිරීක්ෂණය විය.වන්දි මුදල සංශෝධනය කිරීම පිළිබඳව සභාවේ අවධානය යොමුකර ඇති බව සභාපතිවරයා දැනුම් දී ඇත.

(ii). **ඉල්ලුම් පත්‍ර ලැබීම හා වන්දි ගෙවීම**

දැනට මෙම සභාවේ කාර්යයභාරය පිළිබඳව මහජනයා දැනුවත් කිරීමට පුවත්පත් දැන්වීම්, දැයට කිරුළ පුදර්ශනවලදී දැනුවත් කිරීම වැනි ක්‍රම උපයෝගී කර තිබූ නමුත් ඒවා මහජනයා දැනුවත් කිරීම සඳහා ප්‍රමාණවත් නොවන බව නිරීක්ෂණය කෙරේ.පසුගිය වසර 07 ක විස්තර පහත දැක්වේ.

| වර්ෂය | ලැබුණු අයදුම්පත්‍ර සංඛ්‍යාව | වන්දි ගෙවූ අයදුම්පත් සංඛ්‍යාව |
|---|---|---|
| 2005 | අයදුම්පත් ලැබී නොමැත | වන්දි ගෙවා නැත |
| 2006 | - එම - | - එම - |
| 2007 | 11 | - එම - |
| 2008 | 11 | 13 |
| 2009 | 11 | 13 |
| 2010 | 49 | 10 |
| 2011 | 61 | 07 |
| | 143 | 43 |

(ඇ) **ආදායම් ප්‍රභවය ගණනය කිරීමේ විධිමත් ක්‍රමවේදයක් නොතිබීම**

සභාවේ ප්‍රධාන ආදායම් ප්‍රභවය වන රක්ෂණ ආයතන වලින් ලැබෙන දායකත්වය නිවැරදිද යන්න ගණනය කිරීම සඳහා කිසදු විධිමත් ක්‍රියා පටිපාටියක් යොදා නොගන්නා අතර ලැබෙන දායකත්ව මුදලේ පමාවෙන වාරික පිළිබඳව කිසිදු විමසිමක් කර නොමැති බව නිරීක්ෂණය විය. සෑම රක්ෂණ සමාගමක් විසින්ම දෙනු ලබන දායකත්වය සභාව විසින් භාරගැනීම පමණක් සිදුකරන අතර එම සමාගම් නිකුත් කරනු ලබන තෙවන පාර්ශවයේ රක්ෂණ ඔප්පු ප්‍රමාණය පිළිබද විමසිමක් සිදු කර නොතිබුණි.

3.2. <u>කළමනාකරණ අකාර්යක්ෂමතා</u>

(අ) 2004 වර්ෂයේදී ආරම්භ කර ඇති මෙම සභාව සඳහා අනුමත කාර්ය මණ්ඩලයක් නොවූ අතර පසුගිය අවුරුදු 07 ඇතුළත මෙම සභාවට ප්‍රවාහන අමාත්‍යාංශයේ නිලධාරීන් වරින්වර අනුයුක්ත කර සභාවේ කාර්යයන් ඉටුකරවාගෙන තිබුණි.

(ආ) ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලයේ ලියාපදිංචි වී ඇති රක්ෂණ සමාගම් නිකුත් කරන මෝටර් වාහන තෙවන පාර්ශව රක්ෂණ ඔප්පුවලින් 1% ක දායක මුදලක් සභාව වෙත එවිය යුතු වුවත් රක්ෂණ සමාගම් 2 ක් විසින් දායක මුදල 1% කට අඩුවෙන් ලබාදීම නිසා සභාවට අහිමි වී ඇති ආදායම රු.5,623,485 ක් විය.

3.3. <u>අරමුදල් ඌන උපයෝජනය</u>

සමාලෝචිත වර්ෂය තුලදී රු.43,634,852ක මුදලක් මාසිකව බැංකු ගිණුමේ අඛණ්ඩව පැවතුණි. සභාවේ මෙහෙයුම් සඳහා ප්‍රමාණවත් මුදලක් තබාගෙන ඉතිරි අතිරික්ත අරමුදල් භාණ්ඩාගාරයේ අනුමැතිය ඇතිව භාණ්ඩාගාර තාවකාලික අතිරික්ත අරමුදලෙහි ආයෝජනය කිරීමට හෝ වෙනත් ඵලදායී ආයෝජනයක් සඳහා යෙදවමට කටයුතු කර නොතිබුණි.

4. <u>ගිණුම් කටයුතු භාවය හා යහපාලනය</u>

4.1. <u>මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම</u>

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී 12 දරන රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු චක්‍රලේඛයේ 6.5.1 ඡේදය ප්‍රකාරව මුදල් වර්ෂය අවසාන වී දින 60 ක් තුල වාර්ෂික මූල්‍ය ප්‍රකාශන විගණනයට ඉදිරිපත් කළයුතු වුවත් 2011 වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන විගණනයට ඉදිරිපත් කරන ලද්දේ 2012 ජුනි 12 දිනදීය.එනම් දින 103 ක ප්‍රමාදයකින් පසුවය. නිසි කාර්ය මණ්ඩලයක් නොමැති වීම මීට හේතු වී තිබුණි.

## 4.2. සංයුක්ත සැලැස්ම

2003 ජුනි 02 දිනැති අංක පීඊඞී 12 දරන රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු චක්‍රලේඛයේ 5.1.2 ඡේදය ප්‍රකාරව ආයතනයේ දර්ශනය හා මෙහෙවර ඉටුකර ගැනීම සඳහා ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර තිබුණ ද සංයුක්ත සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

## 4.3. අභ්‍යන්තර විගණනය

සභාව ආරම්භයේ සිට සමාලෝචිත වර්ෂය දක්වාම අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කිරීමට කටයුතු කර නොතිබූ අතර, අදාල අමාත්‍යාංශය මගින් හෝ සමාලෝචිත වර්ෂයේදී අභ්‍යන්තර විගණනයක් සිදු කිරීමට කටයුතු කර නොතිබුණි.

## 4.4. අයවැය ලේඛනමය පාලනය

සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ලේඛනයක් පිළියෙල කර තිබුණද සමාලෝචිත වර්ෂයේ වියදම් සම්බන්ධයෙන් පරීක්ෂා කිරීමේදී සමහර විෂයයන් සඳහා අනුමත ප්‍රතිපාදනයන් ඉක්මවා වියදම් කර තිබූ අතර, සමහර විෂයයන් සඳහා ප්‍රතිපාදිත මුදලින් ප්‍රමාණවත් මුදල් ප්‍රමාණයක්වත් වැයකර නොතිබුණි. මේ අනුව අයවැය ලේඛනය වියදම් සම්බන්ධයෙන් ඵලදායී පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

## 5. පද්ධති හා පාලනයන්

පහත සඳහන් ක්ෂේත්‍රයන් තුල විවිධ අඩුපාඩු නිරීක්ෂණය වූ අතර වරින් වර ඒ සම්බන්ධයෙන් සභාව දැනුවත්කර ඇති අතර සභාවේ විශේෂ අවධානය පහත සඳහන් කේෂත්‍ර පිළිබඳ යොමු විය යුතු වේ.

(අ) ගිණුම්කරණය

(ආ) ආයෝජනය හා පොළී ගණනය

(ඇ) රක්ෂණ සමාගම් වලින් ලැබෙන දායකය හඳුනාගැනීමේ හා ප්‍රේෂණය කිරීමේ ප්‍රමාදයන් වලක්වා ගැනීමට ක්‍රියාමාර්ග ගැනීම